www.kidworship.kr

# අන්තිම රාත්‍රී භෝජනය

-The Last Supper-



129Page

**පොතේ ගුරා** පාස්කුව නම් මුහුන් නුමුස් රොටී මංගලයය ළගා වුණා. පාස්කුවෙන් අරුත් ගන්වන්නේ ඉශ්‍රයෙල් සෙනග ඊජිප්තුවේ වහල්කමින් නිදහස් වී පැමිණීම සහ ජාතියක් විදිහට ඔවුන් දිනාගත් නිදහස සැමරීමයි. ඉශ්‍රායෙල්වරුන් පාස්කුව, ඉතාමත් ප්‍රීතිමත් එකක් වන අතර එය අනිවාර්යයෙන්ම සමරන්නාවූ මංගලයයක්ද වන්නේය. පොළොවේ සිටි කාලය අවසන් බවත් ඉක්මණින්ම ස්වර්ගයට යාමේ දවස් පැමිණ ඇති බවත් යේසුස්වහන්සේ මේ වන විට දැනගෙන සිටියා. ඒ නිසා මෙම පාස්කුවට කලින් උන්වහන්සේ රාත්‍රී භෝජනය ගැනීම පිණිස තමුන්ගේ ගෝලයන්ට ඇරයුම් කළා.

..........



130Page

**පොතේ ගුරා** එදා ගෝලයන් සෑම දෙනාම මේසය වටේට අසුන් ගත්තාට පසුව, යේසුස්-වහන්සේ තම ගෝලයන්ගේ පාද සෝදන්ට පටන් ගත්තා. ගෝලයන් මෙය ඇදිහිය නොහැකිව පුදුමයට පත් වුණා.

**ගෝලයන්** ස්වාමිනි ! ඔබවහන්සේ කොහොමද අපේ පාද සෝදන්නේ ? මේක හරි නෑ. මේක හරි නෑ.

**පොතේ ගුරා** ගෝලයන් අකමැති වුණාට යේසුස්වහන්සේ සෑම ගෝලයෙක්ගේම පාද සේදුවා. ඇයි මෙහෙම කරන්නේ කියා, ගෝලයන් දැනගෙන සිටියේ නෑ. අන්තිමට පේදුරුගේ පාද සෝදන තැනට ආවා.

**පේදුරු** ස්වාමිනි, ඔබවහන්සේ දාසයෙක් වගේ මගේ මේ කිළිටි කකුල් සොදන්නද යන්නේ ? නෑ නෑ ඔබවහන්සේ කවදාකවත් මගේ කකුල් නම් සෝදන්නේ නෑ.

**යේසුස්වහන්සේ** මම ඔබගේ පාද සේදුවේ නැතිනම් ඔබට මා සමග පංගුකාරමක් ඇත්තේ නෑ.

**පේදුරු** එහෙනම් ස්වාමිනි ඔබවහන්සේ මගේ කකුල් දෙක විතරක් නෙවෙයි, මගේ අත් දෙකයි, හිසයි ඔක්කොම සෝදන්න...

**පොතේ ගුරා** පේදුරු තමුන්ගේ මනස වෙනස් කරමින් එයාව වැඩියෙන් සෝදන්නැයි කියා ඉල්ලා සිටියා.

..........



131Page

**පොතේ ගුරා** සෑම ගෝලයෙක්ගේම දෙපා සෝදා අවසන් වූ පසු යේසුස්වහන්සේ මේසේ වටේට වාඩිවෙලා සිටි ගෝලයන්ට කතා කරන්න පටන් ගත්තා.

**යේසුස්වහන්සේ** ඔයාලගේ ස්වාමින් හා ගුරුතුමා වන මම ඔයාලගේ පාද සේදුවා නම්, ඔයාලත් අනිවාර්යයෙන්ම එකිනෙකාගේ පාද සේදිය යුතු වෙනවා. මම ඔයාලට ආදර්ශයක් දුන්නේ. මම ඔයාලට කළා වගේම ඔයාලත් එකිනෙකා වෙනුවෙන් එය කළ යුතු වෙනවා.



132Page

**පොතේ ගුරා** යේසුස්වහන්සේගේ වචනවලින් ගෝලයන් සිත් ලැජ්ජාවට පත් වුණා. යේසුස්වහන්සේ රොටී ගෙන ස්තුති කොට කඩා, ගෝලයන්ට බෙදා දෙනවා.

**යේසුස්වහන්සේ** මේ කුසලානය ඔබ වෙනුවෙන් වගුරුවනු ලබන මගේ ලේවලින් පිහිටුවන අලුත් ගිවිසුමේ ලේ ය. සියලු දෙනාම ඔවුන්ගේ පව්වලින් ගළවන්නාවූ අලුත් ගිවිසුමේ ලේ මේය. මා සිහිවීම පිණිස මෙය කරන්න.

.................................................................................................



133Page

**පොතේ ගුරා** යේසුස්වහන්සේ ගෝලයන්ට කතා කර,

**යේසුස්වහන්සේ** ඔයගොල්ලන්ගේ එක්කෙනෙක් මාව පාවා දෙන්නට යනවා.

**පොතේ ගුරා** යේසුස්වහන්සේ, එය කීවේ උන්වහන්සේ පාවා දෙන්නට සිටි යුදස් ඉස්කාරියොත් ගැනයි. ගෝලයන් හැමදෙනාම පුදුම වෙන්න පටන් ගත්තා. යේසුස්වහන්සේ නැවතත් කතාකොට:

**යේසුස්වහන්සේ** මගේ මරණය දෙවියන්වහන්සේගේ කැමැත්තයි. ඒ වුණාට මාව පාවා දෙන මිනිසාට වෙන විපතක මහත. ඔහු දැනටමත් නොඉපදුනා නම් ඔහුට ඒ යහපත.

**පොතේ ගුරා** ගෝලයන් හොඳටම භය වෙලා... යේසුස්වහන්සේගෙන් මෙහෙම අහනවා,

**ගෝලයා** ස්වාමිනි ඒ මමද ?

**යේසුස්වහන්සේ** මම මේ රොටී කැබැල්ල දෙන කෙනා...

**පොතේ ගුරා** එය යුදස් ඉස්කාරියොත්ට දෙනවා. යේසුස්වහන්සේ යුදස්ට කතාකොට,

**යේසුස්වහන්සේ** ඔබ කරන්නට යන දේ ඉක්මණින් කරන්න...

**පොතේ ගුරා** යේසුස්වහන්සේ යුදස්ට කතා කළායින් පසුව, තමුන්ගේ හෘදය සාක්ෂියට පිහියෙන් ඇන්නාක් මෙන් දැණුන යුදස් නැගිට යන්නට වුණා. යුදස් කරන්නට සැලසුම් කර තිබූ දේ අනෙක් ගෝලයන් දැනගෙන සිටියේ නෑ.

.................................................................................................



134Page

**පොතේ ගුරා** රෑ කෑමෙන් පසුව යේසුස්වහන්සේ නැවතත් තමුන්ගේ ගෝලයන්ට කතා කරනවා. ඔබලා මේ වනතුරු මා පසුපස ආවා, මෙතැන් සිට ඔබලා මා පාවාදී විසිරෙන්නට යනවා.

**පේදුරු** ස්වාමිනි... මේ හැමදෙනාම ඔබවහන්සේව පාවා දුන්නත් මම නම් එසේ කරන්නේ නෑ. මම නම් කවදාවත් ඔබවහන්සේය පාවා දෙන්නේ නෑ.

**පොතේ ගුරා** ගෝලයන් 12 දෙනාගෙන් යේසුස්වහන්සේ පේදුරුටත් ගොඩක් ආදරේ කළා. යේසුස්වහන්සේට පේදුරුට මෙහෙම කීවා,

**යේසුස්වහන්සේ** පේදුරු, මම ඔයාට සත්‍යයක් කියන්නම්, අද රෑ කුකුළා හඬලන්න කලින් තුන්වතාවක්ම ඔබ මාව හඳුනන්නේ නෑ කියා කියන්නට යනවා.

**පොතේ ගුරා** පේදුරුට කේන්ති ගිහින් මෙසේ කියනවා,

**පේදුරු** මට ඔබවහන්සේ සමග මැරෙන්න සිදු වුණත් මම නම් ඔබවහන්සේ හඳුනන්නේ නෑ කියා කියන්නේ නෑ.

**පොතේ ගුරා** යේසුස්වහන්සේ ගෝලයන්ට කතාකොට,

**යේසුස්වහන්සේ** මම යන ස්ථානයට ඔයාලට දැන්ම එන්න බැරි වුණත්, පසුව ඔබලාත් එහි එනවා. මම ඔබලාට ස්ථානයක් පිළියෙල කරන පිණිස ස්වර්ගයට යනවා. ඊට පස්සේ මම සිටින ස්ථානයේම ඔබලාත් සිටින පිණිස මම නැවත ඇවිත් ඔයාලව රැගෙන යනවා.

**පොතේ ගුරා** මේ ආකාරයෙන්, යේසුස්වහන්සේ නැවතත් එන බවට තමුන්ගේ ගෝලයන්ට පොරොන්දු වෙනවා. එසේ කියා හැමදෙනෙක්ම කෑම කා විනෝද වෙනවා.

.................................................................................................



135Page

| | |
|---|---|
| **පොතේ ගුරා** | යේසුස්වහන්සේ සහ ගෝලයන් එදා රොටී සහ වයින් බෙදාගෙන කෑම, මේ දවස දක්වාම සමරනු ලබනවා. අද ඒක හඳුන්වනනේ, රාත්‍රී බෝජනය ලෙයසි. මේ තුළින් අපේ පව් උදෙසා කුරුසියේ මැරුණු යේසුස්වහන්සේ ව සිහිකරමින් ස්තුති කිරීම සිදුකරනු ලබනවා. |
| **ජීවිතයට අදාල කිරීම** | දුවේ පුතේ, යේසුස්වහන්සේ අපේ පව් නිසා දුක් විඳින්න සූදානම් වුණා. පුදුමයි නේද? උන්වහන්සේගේම ශරීරය අපි නිසා තුවාල වෙන්නයි යන්නේ. අපි අද එතුමන්ට කියමු.."යේසුනි මා නිසා කැමැත්තෙන්ම ඔබවහන්සේ දුක්විඳීම තෝරා ගත්තා.. ඒකට මම ගොඩක් ස්තුති කරන්න කැමතියි." |